චක්‍රලේඛ අංක : 1993/06

මගේ අංකය: 2/ ක්‍රීවිබා/ 1/ 9
ක්‍රීඩා හා විෂය බාහිර කටයුතු ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
බත්තරමුල්ල.
1993 මැයි මස 14 දින

1 පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
2 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.

## ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් පත් කිරීම සහ මාරු කිරීම

දනට සේවයේ යෙදී සිටින ශාරීරික අධ්‍යාපන සහ ක්‍රීඩා ගුරුවරුන්ගේ සංඛ්‍යාව දිවයින පුරා පාසල්වල ශාරීරික අධ්‍යාපන සහ ක්‍රීඩා ගුරු පුරප්පාඩු සංඛ්‍යාව සපුරාලීම සඳහා කිසියේත් ප්‍රමාණවත් නොවන බැවින්. ඊට පිළියමක් වශයෙන් පහත සඳහන් ප්‍රතිපත්තීන්ට අනුව ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා ගුරුවරුන් පත් කිරීම සහ මාරු කිරීම ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

| | | |
|---|---|---|
| 01 | ශිෂ්‍ය සංඛ්‍යාව 2000 ට වැඩි පාසල් සඳහා | - ගුරුවරුන් දෙදෙනෙක් |
| 02 | ශිෂ්‍ය සංඛ්‍යාව 2000 ට අඩු පාසල් සඳහා | - ගුරුවරුන් එක්කෙනෙක් |
| 03 | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ක්‍රීඩා පාසල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පාසල් සඳහා | - ගුරුවරුන් පස් දෙනෙකු දක්වා |
| 04 | ජාතික පාසල් සඳහා | - ගුරුවරුන් තිදෙනෙකු දක්වා |

ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ගුරුවරුන් පත් කිරීමේදී හා මාරු කිරීමේ දී සේවා අවශ්‍යතාවන් සලකා ඒ ඒ ප්‍රදේශ භාරව කටයුතු කරන ශාරීරික අධ්‍යාපනය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශය මත ම කළ යුතු බව අවධාරණය කරමි.

දනටමත් ඉහත සඳහන් තීරණයන්ට අනුව අතිරික්තව සිටින ගුරුවරුන් වෙනත් පුරප්පාඩු ඇති පාසල්වලට මාරුකර යැවීමට වහා ම කටයුතු කළ යුතුය.

එම්. ඩී. ඩී. පීරිස්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ
ලේකම්.

පිටපත් :

1 කලාපීය අධ්‍යක්ෂවරුන්,

2 කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,

3 ශා. අ. පිළිබඳ නි. අ. අ./ ස. අ. අ. වරුන්

(දන ගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා)